# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1931/16 - 2015 සැප්තැම්බර් මස 09 වැනි බදාදා - 2015.09.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය.*: අත්/කඩු/130/UDA.

මහජන කටයුත්තක් සඳහා පහත දැක්වෙන *ඉඩම/පරවශ්‍යතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්පත්කරගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්පත් කරගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන *ඉඩම/පරවශ්‍යතාවේ විස්තර* :

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 492/ශ්‍රී සුභූතිපුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බත්තරමුල්ල ගමේ පිහිටි කොළඹ දිස්ත්‍රික් මැනුම් අධිකාරි විසින් පිළියෙල කරන ලද මූලික පිඹුරු අංක කො. 9546 හි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0683 පමණ වූ පහත විස්තර සඳහන් ඉඩම් කොටස් වල මායිම්.

*මූලික පිඹුරු අංක 9546හි කැබලි අංක 01 සිට 02 දක්වා*

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: පොල්දූව; වර්තමාන ඉඩම් පරිහරණය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: තන්තිරිවත්තගේ දෝන නන්දනී වජිරපානි, අංක 171, මොරටුව පාර, සුවාරපොළ, පිළියන්දල; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0682.

02. කැබලි අංක 2
ඉඩමේ නම: පොල්දූව; වර්තමාන ඉඩම් පරිහරණය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: තන්තිරිවත්තගේ දෝන නන්දනී වජිරපානි, අංක 171, මොරටුව පාර, සුවාරපොළ, පිළියන්දල; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0001.

ඉහත සඳහන් *ඉඩම/පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළුදෙනාම තමතමන්ගේ හෝ ඔවුන්ගේ ලියකියවිලිවලින් බලය ලත් අයවළුන් හෝ 2015 ඔක්තෝබර් මස 12 වැනි දින පෙ.ව. 10.00ට කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2015 ඔක්තෝබර් මස 05 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම / ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී *ඉඩම/පරවශ්‍යතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල් ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

ඩබ්. එම්. දයාවතී,
ප්‍රාදේශීය ලේකම්,
කඩුවෙල.

2015 සැප්තැම්බර් මස 10 වැනි දින,
කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09-583